# පුරවැසිසේවා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී නිලධාරීන්ගේ දැනුවත්භාවය සහ ආකල්ප

## (ජා-ඇල නගර සභාව ඇසුරින් )

යූ.එල්.එච්.ඩී. පෙරේරා[1]                එම්.කේ. නදීකා දමයන්ති[2]

**සංක්ෂේපය**

නූතනයේ බොහෝ රාජ්‍යයන්හි කාර්යක්ෂම, මිත්‍රශීලි සහ ඵලදායී රාජ්‍ය සේවයක් බිහිකර ගැනීමේ අරමුණින් නව කළමනාකරණ ප්‍රවේශ භාවිතා කරනු ලබයි. 1990 දශකයේ සිට ශ්‍රී ලංකාව ද, මෙම භාවිතාවට එළඹිණි. මෙකී ප්‍රවේශ අතර 2007 වර්ෂයේ හඳුන්වාදෙන ලද පුරවැසි සේවා ප්‍රඥප්තිය වැදගත් කොට සැලකිය හැක. මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වන්නේ, නව කළමණාකරණ ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කිරීමට වෙර දරන පුරවැසි සේවා ප්‍රඥප්තිය සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුවත්භාවය සහ ඒ සම්බන්ධයෙන් දක්වන ආකල්ප කවරේද? යන්න විමසීමයි. ජා-ඇල නගර සභාව කේන්ද්‍ර කොටගෙන මෙම අධ්‍යයනය සිදුකරනු ලැබිණි. අධ්‍යයන ප්‍රදේශය අහඹු ලෙස තෝරා ගත් අතර නියැදිය තෝරා ගැනීමේ දී නගර සභාවේ සේවා නියුක්ත කාර්ය මණ්ඩලයෙන් 50%ක් ආවරණය වන පරිදි නිලධාරීන් සහ සේවකයින් අහඹු ලෙස තෝරා ගැණිනි. එහිදී ආයතනයේ නිලධාරීන්ගෙන් 30%ක් ද, සුළු සේවකයින්ගෙන් 20%ක් ද, නියැදියට ඇතුළත් විය. ඒ අනුව සමස්ත නියැදිය පනහකි. පර්යේෂණය සඳහා ගුණාත්මක සහ ප්‍රමාණාත්මක යන දෙයාකාරයේ ම දත්ත සහ තොරතුරු උපයෝගී කර ගැණිනි. අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතියික දත්ත යොදා ගත් අතර ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ජා සහ නිරීක්ෂණ ක්‍රමවේද උපයෝගී කර ගැණිනි. රැස්කර ගත් ප්‍රාථමික දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රතිශත, ප්‍රස්තාර සහ වගු සටහන් වැනි සරල සංඛ්‍යානමය ක්‍රමවේද භාවිතා කළ අතර ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය භාවිතා කරමින් විශ්ලේෂණය කෙරිණි. අධ්‍යයනයෙන් අනාවරණය වූ මූලික කරුණ වන්නේ ජා ඇල නගර සභාව පුරවැසි ප්‍රඥප්තිය තම කාර්යාලීය පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කරමින් රජයේ ප්‍රතිපත්තියට අනුගත වුවත් ප්‍රායෝගිකව එය ක්‍රියාවට නැංවීම සඳහා ක්‍රමවත් ක්‍රියාමාර්ගයක් හෝ විධිවිධාන සලසා නොමැති බවයි. පුරවැසි ප්‍රඥප්තිය පිළිබඳ දැනුවත්භාවය පිරික්සීමේදී කාර්ය මණ්ඩලයෙන් 46.7% (14)ක් වඩාත් හොඳින් ඒ පිළිබඳව දැනුවත්බව ප්‍රකාශ කළ අතර, 53.3% (16)ක් තරමක් දූරට ඒ පිළිබඳ දැනුවත් යැයි ප්‍රකාශ කරන ලදි. එසේම, සුළු සේවකයින්ගෙන් 100% ක් ඒ පිළිබඳව දැනුවත්භාවයකින් තොර වූහ. නිරීක්ෂණවලින් හෙළි වූ කරුණ වන්නේ නිලධාරීන්ගෙන් බහුතරය පුරවැසි සේවා ප්‍රඥප්තියේ සඳහන්

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

අයුරින් සේවා සැපයීමට වඩා තම පෞද්ගලික කටයුතු ඉටුකර ගැනීම සඳහා රාජකාරි කාලය මිඩංගු කරන බවයි.

**මුඛ්‍ය පද ඃ** *පුරවැසි සේවා ප්‍රඥප්තිය, ජා ඇල නගරසභාව, නව කළමණාකරණ ප්‍රවේශ, රාජ්‍ය සේවය, නිලධාරින්*